ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ඩෙල්ෆ්ට්, නයිනතිව් සහ අනලයිතිව් දූපත්වල දෙමුහුන් විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා පළමු වාරිකය භාර දේ**

යාපනයේ දූපත් තුනක දෙමුහුන් විදුලි බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළමු වාරිකය ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපති රන්ජිත් සේපාල යන මහත්වරුන් වෙත 2024 අගෝස්තු 28 වන දින භාර දෙන ලදි.

2. ඩෙල්ෆ්ට්, නයිනතිව් සහ අනලයිතිව් දූපත්වල දෙමුහුන් විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා අවබෝධතා ගිවිසුමක් 2022 මාර්තු මාසයේදී ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර අත්සන් තබන ලද අතර ඉන් අනතුරුව බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා වන ගිවිසුම 2024 මාර්තු 1 වන දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ M/S යූ සෝලා ක්ලීන් එනර්ජි සොලියුෂන්ස් පුද්ගලික සමාගම අතර අත්සන් තැබිණ.

3. ජාතික පද්ධතිය හා සම්බන්ධ කර නොමැති මෙම දූපත් ත්‍රිත්වයෙහි ජනතාවගේ බලශක්ති අවශ්‍යතා සපුරාලීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර එහිදී ධාරිතාවයන් ප්‍රශස්ථකරණය උදෙසා සූර්ය සහ සුළං යන ප්‍රභවයන් දෙකම භාවිතා කරනු ඇත.

4. විදුලි බලාගාර ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතිය 2025 මාර්තු මුල වන විට අවසන් කොට 2025 අප්‍රේල් අග වන විට භාර දීමට නියමිතය.

5. ව්‍යාපෘතිය ඉන්දියානු රජයේ ඇමරිකානු ඩොලර් මිලියන 11ක ප්‍රදානයක් යටතේ ක්‍රියාවට නැංවෙන අතර එය ශ්‍රී ලංකාව තුළ ඉන්දියාවේ සංවර්ධන හවුල්කාරිත්ව මුලපිරීම්වල මනුෂ්‍ය කේන්ද්‍රීය ස්වභාවය මෙන්ම බලශක්ති ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගීතාවයට ඉන්දියාවේ කැපවීම අවධාරණය කරයි.

***

කොළඹ
2024 අගෝස්තු 29